**හම්බන්තොට මහා නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද නගරාධිපති ඇතුළු සභිකවරුන්ට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයත් පෙර වර්ෂයේ අවසන් ශේෂයත් අතර ගිණුම් ශේෂ 07 කට අදාළව එකතුව රු. 3,948,063 ක් අඩුවෙන් / වැඩියෙන් දක්වා තිබුණි. | ඉකුත් වර්ෂයේ ශේෂ නිවැරදිව ඉදිරියට ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම සකස් කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභා දේපල සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු. 378,274 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයගැති හා ණය හිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 569,800 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ලද මුද්දර ගාස්තු උපලේඛන පමණක් ගිණුම්ගත කර ඇත. |

### (ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 09 කට අදාළ එකතුව රු. 17,363,437 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 751,412 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙනස පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### (ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු. 3,662,834 ක් වූ ගිණුම් විෂයයන් 17 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | රටේ පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් තොරතුරු ලබා දීමට නොහැකි වීමත්, ඉදිරි වර්ෂයේදී උපලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම හා ගෙවිය යුතු වැට් බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මුද්දර ගාස්තු, කලින් ලද ආදායම සඳහා පිළිතුරු සමඟ උපලේඛන ඉදිරිපත් කළ බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 230 (1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා වරිපනම් බදු තක්සේරු කර අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී සියළුම කොට්ඨාශ වලින් වරිපනම් බදු හා අනෙකුත් බදු අය කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------- | | | |
| (i) | මු.රෙ. 571 | වසර දෙක ඉක්මවූ වටිනාකම රු.231,214 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමි. |
| (ii) | මු.රෙ. 702 (3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම් වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කර්මාන්ත ගිවිසුම්වල පිටපත් විගණනයට ඉදිරිපත් කරමි. |
| (iii) | මු.රෙ. 1645 (ආ),(ඇ) සහ 1646 | සභාවේ වාහන 24 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සියළුම වාහන වල ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරියේදී සෑම මසකම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙනත් චක්‍රලේඛ හා ලිපි<br>------------------------- | | | |
| (i) | දකුණු පලාත් ප්‍රධාන ලේකම්ගේ (මුදල්) 2014 පෙබරවාරි 24 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය | ඇප තැබිය යුතු නිලධාරීන් 08 දෙනෙකුගෙන් සේවක ඇප ලබා ගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වන විට සේවකයින් 08 දෙනා සේවක ඇප තැන්පත් කර ඇති බව දන්වමි. |
| (ii) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/REG/ 2015/08 පොදු (i) දරණ ලිපියේ 4.3 (අ), (ඉ) ඡේදයන් | ස්ථාන මාරු වී ගිය සහ සේවය හැර ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවීමට ඇති රු. 751,542 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යොමු ගත ලිපියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරුවූ නිලධාරියගෙන් 2020 වර්ෂයේදී රු. 326,790 ක් අයකරගෙන ඇති අතර, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් විශ්‍රාම පාරිතෝෂිත මුදලින් හා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,017,429 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,198,539 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,528,291 | 7,548,639 | 7,058,897 | 2,229,058 | 5,627,613 | 6,086,497 | 4,377,135 | 1,919,022 |
| කුලී | 28,221,051 | 21,585,957 | 21,120,705 | 916,238 | 14,909,185 | 15,237,900 | 4,753,682 | 459,282 |
| බලපත්‍ර ගාස්තු | 3,512,000 | 4,327,471 | 3,633,621 | 746,950 | 5,053,000 | 4,214,873 | 4,061,123 | 149,500 |
| වෙනත් ආදායම් | 3,782,000 | 8,679,625 | 5,340,257 | 4,436,387 | 10,798,000 | 9,580,086 | 17,123,628 | 4,298,160 |
| එකතුව | 42,043,342 | 42,141,692 | 37,153,480 | 8,328,633 | 36,387,798 | 35,119,356 | 30,315,568 | 6,825,964 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු වරිපනම් බදු රු. 2,187,558 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදලින් 2020 මැයි 30 දින වන විට රු.235,465 ක් අයකර ගෙන ඇති බව දන්වමි. |
| (ආ) | වරිපනම් දේපල වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2013 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද බදු අයකර තිබුණි. | වසර 05 කට වරක් තක්සේරු සංශෝධනය කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කටයුතු 2019 ජුලි 08 දින සිට ආරම්භ කර 2020 ජනවාරි 17 දින අවසන් කර ඇති බවත්, ඊට අදාල තක්සේරු වාර්තා මෙතෙක් සභාවට ලැබී නොමැති බව දන්වමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කුලී ආදායම රු. 28,221,051 ක් හා බිල්කළ ආදායම රු. 21,585,957ක් වූයෙන් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | විගණන ඡේදය සමඟ එකඟ බව දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බලපත්‍ර ගාස්තු ආදායම රු. 3,512,000 ක් හා බිල්කළ ආදායම රු. 4,327,471 ක් ද වූයෙන් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | ඇස්තමේන්තු පිළියෙල කරන විට සභා බල ප්‍රදේශය තුළ නොතිබුණද වර්ෂය තුළ නව දැන්වීම් පුවරු සවි කිරීම නිසා ඇස්තමේන්තුව සත්‍ය ආදායම සමඟ වෙනස් වූ බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 93,750 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 02 ත් 03 ත් අතර හිඟ හිටි ශේෂය රු. 61,250 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟයෙන් 2020 මැයි 30 වන විට රු. 8,500 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරි හිඟ ඉදිරියේදී අයකර ගන්නා බව දන්වමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 112,000 ක් හා රු. 3,284,500 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ උසාවි දඩ වලින් රු. 112,000 ක් හා හිඟ මුද්දර ගාස්තු වලින් රු. 2,640,000 ක් අයවී ඇති බවත්, ඉතිරි හිඟ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 32 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කරුණු 29 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණයෙහි සඳහන් ඉතිරි අතුරු ව්‍යවස්ථා 03 වැලඳගෙන නොමැති බවත්, ඉන් XI හා XXIV ව්‍යවස්ථා මහ නගර සභාවට අදාළ නොවන බවත්, XXIII වන ප්‍රචාරක දැන්වීම් පුවරු අතුරු ව්‍යවස්ථාව දැනට වැලඳගෙන ඇති බව දන්වමි. |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මහා නගර සභා ආඥාපනතේ 04 වන වගන්තිය ප්‍රකාරව සභාවට පැවරී ඇති කාර්ය භාරය අනුව හා 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම්ව සැලසුම් සකස්කර ඇති බව දන්වමි. |

**(ඇ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා අරමුදලින් කරනු ලබන කර්මාන්ත හා සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වාර්ෂිකව සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන සැලසීම සිදු කළ යුතුවේ. | 2019 වර්ෂයේ පුනරාවර්ථන ආදායම පුනරාවර්ථන වියදම දැරීමට පමණක් ප්‍රමාණවත් වූ බැවින් කර්මාන්ත හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන සැලසීමට නොහැකි වූ බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නිල නිවාස 07 ක් ලිඛිත ගිවිසුම් මඟින් භාරදී නොතිබුණි. | ලිඛිත ගිවිසුම් මඟින් නිල නිවාස භාරදී ගොනු යාවත්කලීන කළ යුතුවේ. | මේ වන විට ලිපි ගොනු යාවත්කාලීන කර ඇති බව සහ මේ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 29 ක් පිරවීමට හා අතිරික්ත 52 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරන අතර, ඒ සම්බන්ධව ඉල්ලීම් කළ බව දන්වමි. |
| (ආ) | නිලධාරීන් පස් දෙනෙකු නිත්‍ය රාජකාරිවලින් පරිබාහිර වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. | තනතුරට අදාළ රාජකාරිවල යෙදිය යුතුවේ. | සභාවේ පවතින පුරප්පාඩු හේතුවෙන් නිත්‍ය රාජකාරී වලින් බැහැරව වෙනත් රාජකාරී වල යොදවා ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් රු. 24,181 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැටුප් රහිත නිවාඩු දීමනා කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛය පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්ම සංස්කරණය කළ බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් 42 ක හා වාහන 07 ක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා නොගත් වාහන පවරා දෙන ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කළ අතර, ඉඩම් පවරා දෙන ලෙස අදාළ ආයතනයන් දැනුවත් කලෙමි. |

**3.4.2 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු නිල නිවාස 02 ක් සහ සිනමා ශාලාවක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | නිල නිවාස 2021 වර්ෂයේදී අළුත්වැඩියා කිරීමට සටහන් කරගත් බවත්, ගොඩනැඟිල්ල පිහිටි ප්‍රදේශය පිළිබඳව අධ්‍යනයක් සිදු කර සුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර එම සැලැස්ම කාලීනව සමාලෝචනය කිරීමටත් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත්ව කාල රාමු සකස් කර නොතිබුණි. | විධිමත්ව ප්‍රසම්පාදන සැලසුම හා කාලරාමු සකස් කළ යුතුවේ. | 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම සකස් කිරීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි කටයුතු කරමි. |